කාර්ය මණ්ඩල චක්‍රලේඛ ලිපි අංක : 07/2018

මගේ අංකය : සීජී/1/2/5/පිඹුරු වර්ණ/වි.ශ්‍රේ.උ.

දෙපාර්තමේන්තු සේවා අංශය
මිනින්දෝරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

2018.02. 22

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ(මැ.සි.ආ.)/අධ්‍යක්ෂ(මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්/ මිනින්දෝරු අධිකාරිවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි/සිතියම් නිෂ්පාදන නිලධාරි,
කාර්මික හා පරිපාලන නිලධාරිවරුන් / පරිපාලන නිලධාරි
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්,

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම.**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට අදාල අයදුම්පත් කැඳවීමේ නිවේදනය මේ සමඟ අමුණා ඇත. ඒ අනුව කටයුතු කිරීමටත් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමටත් කරුණාකර කටයුතු කරන්න.

එච්.අයි.සඳමාලි
සහකාර අධ්‍යක්ෂ(පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම.**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී පළමු පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම්:**

I. අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික (MN-03)සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(2015.09.01 දිනැති අංක 1930/12 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)

**02. මාසික වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය: MN7-2016**

මාසික වැටුප රු. 41,580 – 11x755-18 x 1030- 68,425/=

- මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වන අතර රා.ප.ච 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ලැබේ.

**03. උසස් කිරීමේ ක්‍රමය:**

අභ්‍යන්තරව හා වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරන දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ලකුණු ලබාදීමේ පටිපාටියක් අනුව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පරිපාටිය පහත පරිදි වේ.

| <u>මිනින්දෝරුදෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී තනතුරට පත් කිරීම</u> | ලකුණු | මුළු ලකුණු |
|---|---|---|
| **1. සේවා පළපුරුද්ද සඳහා ලකුණු:**<br>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී) I පන්තියේ වසර 06 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු එක් වර්ෂයකට ලකුණු 05 බැගින් | | **50** |
| **2. කුසලතාවය සඳහා ලකුණු**<br>පහත නිර්ණායක වලට අදාළව ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම තුලින් කුසලතාවය මැන බලනු ලැබේ. | | **45** |
| I. සියළු වර්ගවල ක්ෂේත්‍ර පොත් අංකනය කිරීමට ඇති හැකියාව. | 12 | |
| II. හස්ත මුද්‍රණ ක්‍රමය භාවිතා කර සිතියම්වල අක්ෂර මුද්‍රණය කිරීමට ඇති හැකියාව | 11 | |
| III. දෙපාර්තමේන්තුවේ සහරා, ලිපි, ශීර්ෂ, කාඩ් පත්, පෝරම යනාදියේ මුද්‍රණ පිටපත් සැකසීමට ඇති හැකියාව සහ සෝදුපත්කරණය | 11 | |
| IV. මුද්‍රණ පිටපත් කිහිපයක් එකතු කර මුද්‍රණ ඵලක සෑදීම සඳහා අවශ්‍ය විශාල ප්‍රමාණයේ සර්පණ ප්‍රතිබිම්බ සෑදීමට ඇති හැකියාව | 11 | |
| **3. සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතාව** | | **05** |
| අ) නායකත්වය | 02 | |
| ආ) සන්නිවේදන හැකියාව | 02 | |
| ඇ) පෞරුෂත්වය | 01 | |
| | | **100** |

2016.02.29 දිනට ඉහත දක්වා ඇති සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා ඇති නිලධාරීන් මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අදාල අධීක්ෂණ නිලධාරියා මගින් සහතික කරවා 2016.03.09 දිනට පෙර දෙපාර්තමේන්තු සේවා අංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කොළඹ 05 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ආචාර්ය ඇයි. එච්. කේ. මහානාම
ලේකම්
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
"මිහිකත මැඳුර" ඉඩම් මහලේකම් කාර්යාලය
අංක 1200/6, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

දිනය